



එඩිය වැඩියේ පොඩියන් ගේ එඩි වඩන්නට යි.

කලබෙකැ මිල සත දහය යි.
දෙලොස් කලබෙකැ මිල රුපියල් එක යි සත පණහ යි.

පහිණ යොමුව :- දෙහිවල පියාලෙන් පාරේ නම්බර 1, එඩියේ සකසු.

# තෙ බස් පිළිවෙළ ගරහමු

සිංහල රටෙහී වත්
සිංහලයට රජයු බස
වන්නට ඉඩ නො දෙමු නම්
ලොවේ කො තැනින් දෙමු ඒ ?

සිංහලයෝ මැ අද
එ තැන දෙමළ කීමෙහි වත්
නොලද දෙමළුවට ද දෙති.
මෙ දුගී රුසට යන කල !

රජයේ කටයුතු
චීන බසින් කළත් කිම ?
හෙළ දරුවනට තෙ බස්
කුමට ද මෙ පටවන්නේ ?

හෙළ බස මවු බස
මෙහි මහ ජන මුලේ බස
උගනුමු වැඩි දැනුමට
ලෝ බස ඉංගිරිසි බස.

ඉංගිරිසිය ලොපා
හෙළයන් නුවණ අඳ කොටැ
දෙමළ දැලේ බඳින්නට
ඇටැවූ උගුල දරුණු යි !

මේ රට දකුණු දඹ –
දිවට ඇඳන්නට ඔබ
නොරිසි නම් පිය හෙළයෙනී
තෙ බස් පිළිවෙළ ගරහමු.

3 වෙළුම | 2497 ඉල් - උඳුවප් / 1953 නොවැම්බර - දෙසැම්බර | 8, 9 කලප්

# හොල්මන

හෙම්සිරි කුමරුවන් විසිනි.

වේලාව සවසැ හත පසු වුණා විතර යි. එ හෙත් එ දා සඳ එළිය ඇති දිනක් නුවූයෙන් "මේ තිත්ත කළුවරේ යන්නට බැරි" යැ යි මම කීමි.

"ඔය බයගුල්ලාට ඉන්නට හැර මේ එළියත් ගෙනැ ආත්තම්මා යන්නැ" යි කියමින් අක්කා දල්වා-ගෙනැ ආ කොළපුව ආත්තම්මාට දුන්නා යැ.

මම ආත්තම්මා ගෙනැ යන්නට ගත් මල්ල ගෙනැ තාත්තා ගේ විදිලි පන්දම හැම තැනැ සෙවීමි; එහෙත් තාත්තා එය ගෙනැ කොහි දෝ ගොස් සිටියෙන් අත්තම්මා හා පිටත් වීමි.

අපේ මාමා ගේ නිවෙස සිටියේ රූමස්සල කන්දේ 'අනත් දරු මඩමට මඳක් ඔබිනි. මා උගන්නා උණවටුනේ බණවිටි පිරිම පා සලටත් එයට යා බඳ කිතුනු හෙළයන් ගේ සොහොන් බිමටත් මැදිනි එහි යා යුතු මග ඇත්තේ.

දැන් අපි සොහොන් බිම පෙනෙන සරියේ යැ. ඔව් අර ඇත්තේ සොහොන් බිම යි. එහි පවුර මිනැ වෙත දා නැති අමුත්තෙකි.

'අර සුදුවට කවරෙක් ද ආත්තම්මේ ?' යි මම අත දිගු කොටැ එ රුව දැක්වීමි.

'ඔව්, පුතා, අර ගිනි පුපුරකුත් වැනෙන්නේ, අපි ගොස් තව කාවුරුන් හෝ කැඳවා-ගෙනැ එමු' යි තැවිනී හැරී බැලුවමු.

'ඒ හා මැ හොල්මන හෙල්ලෙන්නට විය. හා, අර නැගෙන්නේ! ඔන්න තාප්පයෙන් බිමට පැන්නා, ඔන්න ඔන්න අප දෙසට එනවා. අපොයි. අපොයි! අපි කෑ ගසමින් දිව්වමු.

'මේ ඇඳට මා පැමිණියේ කෙ සේ ද ? ආත්තම්මා පසෙකැ සිටැ මා හිස පිරිමදින්නේ ඇයි ද ? යනු සිතමින් වට පිට බැලූ මට පෙනුණේ මා ඇඳ වෙත උන් රත්නායක මහත්මයා යැ. එ වනැ අපට හෙළ බස ඉගැන්වූ ගුරුතුමා යැ ඒ.

මම ඇසීමි ගුරු තුමා ගෙන්, 'මේ කොහි ද ?' යි

'මේ අපේ ගෙදර හෙම්සිරි'

'කෙ සේ ද? අප මෙහි පැමිණියේ;

'මා ඔබ ඔසවා-ගෙනැ ආවා'

'ගුරුතුමාත් දුටුවා ද ඒ හොල්මන ?'

'මම තමා හෙම්සිරි' ඒ හොල්මන. රෑ කෑමෙන් පසු ඇතැම් දින එ පවුර වෙත මඳ වේලාවක් හිඳිනු ම ගේ පුරුද්ද යි.

'ඔබ එ සේ උන් මා හොල්මනැ යි ගෙනැ නැවැතුණා. ඔබට ඒ මා බව කියන්නට හැරුණා මැ ඔබ දෙ පළ දුවන්නට ඉගුළුණා! මැදෑ සී සන් නැති වන තුරු දිවූවා ?'

'ඉතින් අර ගිනි පුපුර'!

'ඒ මා උරමින් උන් දුම් වැටිය යි හෙම්සිරි' එ බසින් මට නුවණ පහළ වියැ.

# බිම්කොෂු වඩු වදන් වැල
## GEOGRAPHICAL TERMS

විනී විතාරණයන් විසිනී.

In the pages that follow is a list of several Geographical Terms, rendered in Sinhalese. In compiling this lexicon, care was taken to give each word a pure Sinhalese form, and hence, much use was made of the more famous Sinhalese classics, including Ruvanmala and Piyummala.

Where appropriate root-forms could not be found, only because certain features are unknown to a geographical region like this land where Sinhalese was spoken, the particular English or Continental term has been given a Sinhalese 'personality'.

This list is far from complete – Geography is called 'an art, a science and a philosophy' and contains many terms which come directly under other departments of study. It is hoped to issue those too, in course of time. *V. V.*

### A

Abyss – ඇද්දිය (ඇත් + දිය)
Advection – තිරස් වහනය
Age, Cambrian – වේල්සි යුගය
Age, Carboniferous – අඟුරුද යුගය
Age, Cretaceous – හුණුද යුගය
Age, Devonian – මින්ද යුගය
Age, Eocene – මූල්නව යුගය
Age, Jurassic – ජූරාද යුගය
Age, Miocene – මැදිනව යුගය
Age, Oligocene – අඩුනව යුගය
Age, Ordovician – ඔර්දෙවිසියානු යුගය
Age, Permian – ගිරිද යුහය
Age, Pleistocene – ඉනව යුගය
Age, Pliocene – නව යුගය
Age, Recent – පවත් යුගය
Age, Silurian – පබළුද යුගය
Age, Triassic – රතුසෙල්ද යුගය
Aggradation – නැගී තැනියනය [තැනී සැදුම]
Agriculture – බිම් වගාව

Area, Catchment - දියවාසිය; අගාරය
Alluvium - බොර පස,
දිය පස, ඔපස,
Altimeter - උසමනුව
Altitude - උස
Anemometer - හුළංමනුව
Anticline - උඩුරැළිය
Antipode - පිළි පාව
[ Pode = පාදය - පාව ]
Anti — Trades - විරුදු වෙළඳ හුළං
Archipelago - (1) කොදෙව් පෙළ
(2) කොදෙව් මුහුද
Area, Irrigable - දිය තරය
Area, Suburban; Suburbs - පිටි නුවර;
පසල් දනවුව
Area, Undulating - රැළි බිම
Arid - සොඳු
Assimilation, Mountains of - රැසි කඳු
Atmosphere - වාමඩල
Atoll - හිරිදූව
Autumn - සරතය; සරා කල
Axis - අක්සය
Azimuth - තිම් සැව්ව

## B

Backwash - බැසිරැලය
Backwater - ගොඩදියර; දරණිය
Barkhan - බාකත
Bar, Off - shore - සිඳුවැටිය
Barometer - වාබරමනුව
Barysphere; Bathysphere; Centrosphere
- දෙරණෝර
Base level - ඉපහත
Basin - හැළි බිම; කැණිය
Batholith - මහ ගැබෝර සෙල
(ගැබ් + ඕර)
Bay - වරාය; බොක්ක
Bearing, Magnetic - සුඹු තෙලය
තෙල ( 'අර' = Yonder ) වූයේ 'තෙලය
Bearing, True - හරි තෙලය
Bearing, Variation of Magnetic - සුඹු තෙල
වෙනෙසියාව
Bed, River - ගඟ පතුල
Bedrock - උදහන සල
[උදහන = උසුලන]

Bench - මුහුදු ඇහේද
Blizzard - හිමහුළඟ
Bore - වඩදිය රැළිය
Boss - ඔරසෙල
(උදර + සෙල)
Brackish - කිවුල්
Breeze - මරු; හුළඟ
Breeze, Land - ගොඩ හුළඟ
Breeze, Sea - මුහුදු හුළඟ
Butte - අතළිය
Buttress, Mountain - කඳු කයිරුව

## C

Canal - ඇළ
Cancer, Tropic of - කකුළු නැබටිය
[නැබටිය - Latitude බලන්නේ යැ.]
Cape - තුඩුව
Capricorn, Tropic of - මුවර නැබටිය
[නැබටිය - Latitude බලන්නේ යැ.]
Capture, River; Beheading of River
- ගංගා ගහණය
Cartography - සිතුවම් ලකුව
Centre, High Pressure - වැවාපෙය
[වැඩි වා පෙළුම ඇති තැන.]
Centre, Low Pressure - අවාපෙය පෙළුම
( අඩු වා පෙළුම ඇති තැන. )
Cereal - දහන්; සස්; බෝග
Chalk - රටහුණු
Channel; Strait - ඔඩය
Circle, Antarctic - පිළිවලස් නැබටිය
[Arctic = වලස්]
[ 'නැබටිය' - latitude බලන්නේ යැ. ]
Circle, Arctic - වලස් නැබටිය
Circle, Great - මහ කවය
Circulation, Air - වාබීමිය
Cirque - සියාකය
Clay - මැටි පස
Clay, Boulder - ගල් මැටි
Clay, Salt - කර මැටි
Cleavage - සිදෙනයුර
[සිදෙන + අයුර]
Cliff - දඹය
Climate - වාගුණය
Climate, Continental - මහදිව් වාගුණය

Climatology – වාගුණලකුව
Cloud – වලාව
Cloud, Cirrus – පියා වලාව
[පියා = Feather]
Cloud, Cumulus – රිළි වලාව
[රිළි = සමූහය]
Cloud, Nimbus – අබ වලාව
(ලතිනයේ Nimbus වදන
'වලා' අරුති. අබ = වලා)
Cloud, Stratus – පේළි වලාව
Cloudiness – වලාබව
Coast, Concordant – අනු වෙරළ
Coast, Discordant – විරුද්ධ වෙරළ
Coast, Submerged – කුඹුටු වෙරළ
Coastline – වෙළතිර
(වෙළත + ඉර)
Col – 1. කපොල්ල
[In Climatology]
2. උස් කපොල්ල
[In relief]
Comet – වල්ගාතරුව
Communication – ගමනාගමනය
Compass – මාලිමාව
Compression, Air – වා තෙරපුම;
වා තෙරපනය
Condensation – බිඳුයනය (බිඳු සෑදීම)
Confluence – ඈඳිය;
දිය දෙකෙළිය;
විනිය
Conglomerate – මුසුසල
Constellation – ගහරුස
Continent – මහදිව
Contour – සමුස් ඉර
[සම + උස්]
Convection – උඩුවහනය
Convergence – එකතුනැමියාව
Cordillera – (කඳු) වැටිරිළුව
Corrasion – අඟරකොහොල
Corrasion, Lateral – පැති අඟරකොහොල
Corrasion, Vertical – ලඹ'තු අඟරකොහොල
Country, Park – දඹමන
Course, River – ගංගා තැනිය

Crater – විවරය; මුව
Crevasse – කිරියසය
Cross-Section – හරස් කඩය
Crust – පපටිකාව, කබල
Crystal – පුපුර
Crystallisation – කැටැසීම
['කැට සැදීම' යන අරුත.]
Cultivation, Dry – ගොඩ ගොවිතැන
Cultivation, Wet – මඩ ගොවිතැන
Current, Ocean – දිය වැල
Cycle, Weather – කල්ගුණ සක
Cyclone – වා (-වායු) සුළිය

**D**

Dam – වේල්ල; වැකන්ද; බැම්ම
Debris – ගහල
Declination – හැරිය
Deep (N) – ගැඹර (තමු)
Defile / Gully – දෙගාරම
Deflection – හැරිය
Deforestation – කැලෑසිඳුම
Degree – අස (කොටස වතුයේ)
Delta – ඩෙල්ටාව
Deposit – නිදහන; තැන්පත
Deposit, Chemical– රස'නු නිදහන
Deposit, Clastic – කැඩි නිදහන
Deposit, Organic – දිවියළු නිදහන
[දිවි (life) යෙන් ගැනුණු]
Deposit, Pelagic – ඇද්දිය-නිදහන
Deposit, Pyroclastic
– ගුනුකැඩි නිදහන
Deposit, Terrigenous
– තොගැඹුරු නිදහන
Depression – 1. වංසුළිය
2. කැණිය; හැළී බිම
Desert – කාන්තාරය ; කතර
Dew – පින්න
Dike / Dyke – වේල්ල
Dip – නැඹුරුව;
නතිය [නතු වූයේ]
Divergence – බෙදී-විහිදියාව
Doldrums – දමත් කඩ
Drainage – බස්නාව

Dainage, Antecedent – පැවැති බස්නාව
Drainage, Dendritic – රුකුරු (රුක් + හුරු) බස්නාව
Drainage, Internal / Inland / Interior – තුළ බස්නාව
Drainage, Radial – අරයැලි බස්නාව [අර (radius) වලැ ඇළුනු]
Drainage, Superimposed – පිටැදි බස්නාව
Drainage, Trellis – කතිරනු බස්නාව
Drift – 1. ඇක්මිය (of water, sand, etc.)
2. පාවි (පාවී පැමිණීයේ)
Drift, Continental – මහදිව් අවතය
Drifting, Longshore – වෙරළ'නු අවතය
Drumlin – ගඬාකන්ද
Dune – වැලිවැටිය

## E

Earth – පොළොව
Earthquake – පොලෝ සැලුම;
මිහි ,, ;
බිම් ,,
Eclipse – රාහුව
Ecliptic – අයනය
Eddy – සුළිය
Elevation – උස
Ellipse – ලෝවාදුව; ඕවලාව
Epicentre – සැලුම් මැදිය
Equator – මහ තැබටිය
['තැබටිය' – Latitude බලන්නේ යැ.]
Equinox – සමරය
Era, Mesozoic – මැදි කප
Era, Palaeozoic – පැරැණි කප
Era, Pre-Cambrian/Archean – පෙර-වේල්සියානු කප / ඉපැරැණි කප
Era, Quaternary – සිව්වැනි කප
Era, Tertiary – තෙවැනි කප
Erosion – සෝදා පාළුව; කොහොල
Erosion, Beach – වෙරළ කොහොල
Erosion, Chemical – රස කොහොල

(පිළියෙළින් පළ වෙයි.)

එඩිරෙහි සකසුවාණන් වෙනුයෙන් අමරසෙන් අහුතුසුවන් විසින් උණවටුනේ පිහිටි ඔවුන් ගේ 'හේළි' පහරුයෙහි පහරවා පළ කැරිණි.